Page 10 February 2010.qxd 19/02/2010 23:23 Page 1



# ජාත්‍යන්තර උසාවියක් හමුවේ සාක්කි දීමට මම සූදානම්!
# ජෙනරාල් ෆොන්සේකා මුළු ලොවටම හඬගා කියයි

**BBC News**

## Fonseka to 'testify on war crimes'



**Sri Lanka's former military commander says that he is prepared to give evidence in an international court on war crime charges against Sri Lanka.**

General Sarath Fonseka speaking to journalists in Colombo on Monday said: " I am not going to save anyone who has committed war crimes ".

International human rights organisations as well as the US state department has alleged that the Sri Lankan government committed war crimes during the final phase of the war against Tamil Tigers.

Several human rights organisations have called to try the Sri Lankan state in international courts on alleged abuses against civilians and surrendees.

During the presidential election where Gen. Fonseka challenged president Mahinda Rajapaksa, both claimed credit for defeating the LTTE.

" I am definitely going to reveal what I know, what I was told and what I heard. Any one who has committed war crimes should definitely be brought into courts, " Gen. Fonseka said.

" Those who reveal the truth are not traitors " he added.

**http://www.bbc.co.uk/sinhala/news/story/2010/02/100208_fonseka_war_crimes.shtml**

ශ්‍රීලංකාවට එරෙහිව ඇති යුද අපරාධ චෝදනා සම්බන්ධයෙන් අන්තර් ජාතික උසාවියක් හමුවේ සාක්කිදීමට තමා සූදානම් බව හිටපු ශ්‍රීලංකා හමුදා ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා මාධ්‍යවේදීන් හමුවේ ප්‍රකාශකර ඇත. බීබීසී ප්‍රවෘත්ති මගින්ද ඒ බව විකාශනය කරන ලදී.

යුද අපරාධ කළ කිසිවෙකු ආරක්ෂා නොකරන බවද ඔහු අවධාරණයකර ඇත. " මා දන්නා සියල්ල ස්ථිර වශයෙන්ම හෙළිකරනවා .මා කී දේත් ඇසූ දේත්. මම හෙළි කරනවා... මම කිසි කෙනෙක් බේරන්න යන්නෙ නෑ අපරාධ කළ සියළු දෙනා ස්ථිර වශයෙන්ම අධිකරණය හමුවට ගෙන ආ යුතුයි " හිටපු හමුදාපතිවරයා සඳහන්කර තිබේ. " සත්‍යය හෙළිකරන මා ද්‍රෝහියෙකු නොවේ " යයි ඔහු වැඩිදුරටත් එහි දී කියා ඇත.

## හිටපු හමුදාපති අත්අඩංගුවට ගත්තේ හමුදා නීතියේ 57 (1) වගන්තිය අනුවයි

### ආරක්ෂක මණ්ඩලයේ සිටිමින් රාජද්‍රෝහී වූ බවට චෝදනා

හිටපු හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා පෙබරවාරි **8** වෙනිදා යුද හමුදා පොලීසිය මගින් යුදහමුදාවේ **57(1)** වගන්තිය යටතේ අත් අඩංගුවට ගන්නා ලද බව හමුදා මාධ්‍ය ප්‍රකාශක මේජර් ජෙනරාල් ප්‍රසාද් සමරසිංහ මහතා ප්‍රකාශ කළේය.

රටේ ආරක්ෂාව පිළිබඳ තීන්දු ගන්නා ආරක්ෂක මණ්ඩලයේ කටයුතුකරමින් සිටියදීම පොන්සේකා මහතා දේශපාලනයට සම්බන්ධවීම හමුදා නීතියට අනුව රාජද්‍රෝහි ක්‍රියාවක් බව ද අනාවරණය වෙයි. යුද හමුදා-වෙන් ඉවත්ව හෝ විශ්‍රාම ගිය අයෙක් හමුදාවේ සේවයේ නියුක්තව සිටියදී කළ වරදක් සම්බන්ධයෙන් හමුදාවෙන් විශ්‍රාම ගොස් මාස 6 ක් ඇතුළතදී අත්අඩංගුවට ගැනීමට නීතිමය හැකියාව තිබෙන බව ද සමරසිංහ මහතා පැවසීය.

යුදහමුදාපති වශයෙන් ආරක්ෂක මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කරද්දී ෆොන්සේකා මහතා යුද නීතියට හා හමුදා නීතියට පටහැනිව ක්‍රියාකර ඇති බව දැනට ලැබී ඇති තොරතුරු අනුව පෙනී ගොස් තිබේ.

මේවන විට හමුදාපතිවරයා සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කර ඇති බව කොළඹ, ජාතික අරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානයේදී පැවති මාධ්‍ය හමුවේදී (9 දා) සමරසිංහ මහතා සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රකාශක ඇමති කෙහෙළිය රඹුක්වැල්ල මහතාත් පැවසූහ.

පරීක්ෂණ මගින් හෙළිවන කරුණු පදනම් කරගෙන නීතිපතිවරයා මගින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගන්නා බව ඇමතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

### යුද අධිකරණයට දඬුවම් නියම කළ හැකියි

### යුදහමුදා පනතේ 57 (1) වගන්තිය මෙසේ දැක්වෙයි

සංග්‍රාමික නීතියට යටත් තැනැත්තෙකු විසින් වරදක් කොට ඉන් ඉක්බිති සංග්‍රාමික නීතියට යටත් බැවින් තොරවූ අවස්ථාවක, ඔහු සංග්‍රාමික සිරබාරයට ගෙන එහි තබා යුද්ධාධිකරණයක් විසින් ඒ වැරදි සම්බන්ධයෙන් ඔහු විනිශ්චයට භාජනය කොට දඬුවම් කළ හැකිය.

එසේ වුවද, ඒ වරද කළ දින සිට හයමසක් ගතවීමෙන් පසු ඒ වරද හමුදා කැරළි ගැසීමේ, පැනයෑමේ හෝ වංචනික ලෙස බඳවාගැනීමේ වරදක් නොවුවහොත් ඒ වරද සම්බන්ධයෙන් ඔහු විනිශ්චයට භාජනය නොකළ යුතුය.

## විපක්ෂයෙන් රජයට චෝදනා

ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අතිශයින් කැළඹී සිටින විපක්ෂ නායක යෝ ඔහු මුදාගැනීම සඳහා රටපුරා උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත්කිරීමට සූදානම් වෙති. ජෙනරාල්වරයා කොළඹ රාජකීය මාවතේ සිය පක්ෂ කාර්යාලයේ සෝමවංශ අමරසිංහ, රවුප් හකීම් හා මනෝ ගනේෂන් යන අය සමග ඉදිරි මැතිවරණ සැළසුම් පිළිබඳව සාකච්ඡා කරමින් සිටියදී මිලිටරි පොලීසිය පැමිණ ජෙනරාල්ට අසභ්‍ය වචනයෙන් බැන වැදී, පහර දී, බිම්දිගේ ඇදගෙන ගොස් වාහනයට දාගත් බව ද ඔව්හු කියති. ඔහු ගෙන ගියා මිසක කොහේ ගෙනගියේදැයි බිරිඳ පවා නොදන්නා බවත් ඔහුගේ ජීවිතය අනතුරේ බවත් මේ පිරිස මාධ්‍යයට කියා ඇත.

### එහෙත් හමුදාව මෙසේ කියයි

හිටපු හමුදාපතිවරයා සිටි ස්ථානයට ගිය මිලිටරි පොලීසියේ උසස් නිලධාරියා මුලින්ම ජෙනරාල්ට ආචාර කර ඇත. ඊළඟට අත් අඩංගුවට ගැනීමට ඇති බලතල කියැවූ නිලධාරියා යළිත් අචාරකොට තමා සමග පැමිණෙන ලෙස ඇරයුම් කරන ලදී. මේ අවස්ථාවේ හමුදා පොලීසියට පරුෂ වචනයෙන් බැනවැදුණු පොන්සේකා මහතා පොලීසිය ගෙන එන ලෙස කියා ඇත. යුද හමුදා පොලීසිය සමග යාමට අකමැත්තක් දැක්වූ නිසා ඔහු ඔසවාගෙන යාමට සිදුව තිබේ. එහෙත් ටික දුරක් එසේ ගිය ජෙනරාල් ඊට පසු කිසිදු බාධාවකින් තොරව යුද හමුදා පොලීසිය සමග ගොස් ඇත.

♦ **චන්ද්‍රිකා පෙරේරා Sri Lanka**

## ලංකාවේ වුන දේ කියුබාවේ වුනානම්!

මම පසුගිය ජූලි මාසයේ කියුබා-වේ අගනුවර හවානාවට සති තුනක නිවාඩුවකට ගියෙමි. ඒ පසුගිය අවුරුදු දහය තුළ මා එහි ගිය තුන්වෙනි වාරයයි. කියුබාව ගැන එහි නොගිය අය කියන දේට වඩා වෙනස් අත්දැකීමක් එහි ගිය විට ලැබේ. එහි ජනතාව විනීතය. මිත්‍රශීලීය. කොපමණ වැරදි තිබුණත් තම රට ගැන නොහොඳක් නොකියති. තමන්ගේ පාඩුවේ ඉන්නට ඔවුන් කැමතිය. මා එහි ගිය විට නවතින්නේ විශ්‍රාමික හමුදා නිලධාරියෙකු වන රවුල් ලෝපෙස් ගේ නිවසේ ය. එම නිවසේ කාමර තුනක් ඔහු සංචාරකයින්ට කුලියට දෙයි. රවුල් ඉතා මිත්‍රශීලීය. ඔහුගේ පවුලේ සියළු දෙන ද එසේ ය. මා ලාංකිකයෙකු බව දැනගත් පසු ඔහුගේ මිත්‍රත්වය තවත් වැඩි විය.

බ්‍රිගේඩියර් රවුල්ගේ නිවසේ බිත්තිවල හැම තැනම එල්ලා ඇත්තේ ඔහු හමුදාවේ සිටියදී ගත් පින්තූර සහ ලත් පදක්කම් සහ කියුබානු මහා විප්ලවයේ පින්තූර කීපයක්ය. කියුබානු විප්ලවය සිදු වූයේ ඔහු පාසැල් යන කාලයේය.

හමුදා ජීවිතය ගැන කියද්දී ඔහු නීතිගරුකව අවංකව සේවය කළේ ය යන හැඟීම මත සෑහීමට පත් වන බව කීවේය. එසේම විනය රැකීම ඉතා වැදගත්ම දෙය බව ද හමුදා විනය කඩකළ යමෙකු වේ නම් ඔහු දඬුවම් ලැබිය යුතු බව ද රවුල් අවධාරණය කළේය.

මේ ඔහු එදා මට කියූ කියුබාවේ වූ සිද්ධියකි.

කියුබානු හමුදා කඳවුරු අප්‍රිකාවේ ඇන්ගෝලාවේ තිබූ කාලයේ ඒ හමුදාවන්හි සේවය කළ උසස් නිලධාරීන්ගේ දූෂණ කටයුතු රාශියක් කැස්ත්‍රෝ රජයට සැලවී තිබුණි. ඒ පිළිබඳ 1989 දී පරීක්ෂණ ඇරඹිණ. ඒ නිලධාරීහු දැන් රජයේ ද උසස් නිල හෙබවූහ. චෝදනා වූයේ මත්ද්‍රව්‍ය ජාවාරම, පගාව ගැනීම හා ස්ත්‍රී දූෂණ කටයුතුය. ඒ අනුව හමුදා මේජර් ජෙනරාල් ආනෝර්ල්ඩෝ ඔචෝවා, කර්නල් අන්තෝනියෝ ඩි ලා ගෝර්දියා සහ බ්‍රිගේඩියර් පැට්‍රිසියෝ ඩිලා ගෝර්දියෝ යන නිලධාරීන් වරදකරුවන් බවට තීන්දු විය. මේ වරදකරුවෝ කස්ත්‍රෝගේ නායකත්වය යටතේ කියුබන් විප්ලවයටද සහභාගිවූ අයද වූහ. එබැවින් ඔවුන් බේරේයයි සමහරු සිතූහ. එහෙත් කියුබානු විප්ලවීය මූලධර්ම වලට අනුව දූෂණය යනු ඉහළම දඬුවම් ලැබිය යුතු වරදකි. එබැවින් ඔචෝවා සහ අන්තෝනියෝ යන දෙදෙනට වෙඩිතබන ලදී. දූෂණයට දඬුවම මරණය නම් රාජද්‍රෝහිවීමට කුමන දඬුවමක් කියුබාවේ දෙනු ඇත් ද?

කියුබාවේ නොව ශ්‍රීලංකාවේ ඉපදීම ගැන ජෙනරාල් ෆොන්සේකා මහතා සතුටු විය යුතු ය.

♦ **රෝහිත ජයරත්න**
**London NW 2**

## ජෙනරාල්ට සියලු පහසුකම් දුන්නා - රජය

අත්අඩංගුවට ගෙන සිටින හිටපු ජෙනරාල් සරත් පොන්සේකා මහතාට අවශ්‍ය සෑම පහසුකමක්ම ලබාදී ඇති බවත්, ඔහු බැලීමට බිරිඳට ඉඩදී ඇති බවත්, ඔහු නම්කරන ඕනෑම නීතිඥයෙකු හමුවීමට අවස්ථාව සළසා ඇති බවත් යුද හමුදා මාධ්‍ය ප්‍රකාශක මේජර් ජෙනරාල් ප්‍රසාද් සමරසිංහ මහතා මාධ්‍යය නිවේදනයක් නිකුත් කරමින් හා සියළු රූපවාහිනී නාලිකාවලටද ප්‍රකාශ කළේය.






## රත්තරන් පිහිය වුනත් ඇනගත්තොත් ඉවරය

ඔබට මතක ඇති මාස දෙකකට උඩදි දෙසැම්බර් කලාපයේ අඬහැරයෙන් මම පොඩි ඉඟියක් කළා. එදා මාතෘකාව වුණේ රත්තරන් පිහිය වුනත් ඇනගත්තොත්? යන අපේ පැරණි කියමන. ඒ කියන්නෙ රත්තරන් පිහිය වුනත් ඇනගත්තොත් හරි, ඒකෙන් කෙනෙකුට ඇන්නොත් හරි, ඒ ඇනුම් කෑ පුද්ගලයා ඒකාන්තයෙන්ම මැරෙනවා. ආයි දෙකක් නෑ.

එදා මම පෙන්නල දුන්න දේ අද සිද්ධ වෙමින් පවතිනවා. මට වගේම ඒ දේ අප රටේ වගකිව යුතු අයට පෙනිලා තියනවා හුඟ කලකට ඉස්සරවෙලා. ඒක වාසනාවක් වුණා. ඒ පියවරවල් ගත්තු එක හොඳට ගියා. එහෙම නොවෙන්න අපේ රට ඒකාන්තයෙන්ම ලොකු අමාරුවක වැටෙන්න තිබුණා. දැන් සිද්ධවෙන දේවල් දිහා බැලුවම අපට මෙවැනි නිගමනයකට එන්න පුළුවන්.

ත්‍රිවිධ හමුදාවේ අණදෙන නිලධාරියා හැටියට ජෙනරාල් සරත් පොන්සේකාගේත්, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක අංශයේ සියළුදෙනාගේත්, ආරක්ෂක ලේකම්වරයා හා ගරු ජනාධිපතිතුමාගේත් පූර්ණ කැපවීමෙන් වසර 30 ක් තිස්සේ කරමින් තිබුණු යුද්ධය ත්‍රස්තවාදීන් සියළු දෙනාම විනාශ කරලා අවසානයකට ගෙනාවා. අපරටේ ජනතාව සැනසුම් සුසුමක් හෙළුවේ ගිය අවුරුද්දේ මැයි 18 වෙනිදා. එදා රාත්‍රියේ තමයි අවුරුදු 30 කට පස්සේ අපේ රටට බයක් නැතුව හරිහැටි නින්ද ගියේ.

යුද්ද ජයග්‍රහණය සිද්ධවුණු හැටියෙම වගේ ජෙනරාල් සරත් පොන්සේකා උතුරට ගිය පළමු වතාවේම උතුරේ ශ්‍රීලංකා සෙබළුන් අමතලා කළ කතාවේ කිසියම් නොපැහැදිලි චෝදනාත් මක තැන් කීපයක් තිබුණා. ඒ චෝදනා කාටද එල්ල කළේ කියලා කාටවත් ඒ මොහොතේ හරි වැටහීමක් තිබුණේ නැහැ. කොහොම නමුත් මට යාන්තම් ඉඟියක් දැනුණා, ඒ කියපු දේ රජයේ ක්‍රියා මාර්ගයක් එක්ක පෑහෙන්නෙ නැති වග. අනික ජෙනරාල් රජයේ ප්‍රත්පත්ති වලට අනුව කටයුතු කරන කෙනෙක්. යම් ගැටළුවක් ඇත්නම් එය රජය සමග පුද්ගලිකව සාකච්ඡා කරනවා ඇරෙන්න මාධ්‍යයත් එක්ක හෝ ජනතාවත් එක්ක හෝ තමන් බැඳී ඉන්න රජය විවේචනය කිරීම රටක හමුදාපති කෙනෙකුට කිසිසේත් සුදුසු නෑ. එයින් තේරෙන්නෙ රජයත් හමුදාවත් දෙපැත්තක ඉන්න බව. මේ අනතුරු හැඟවීම් ආරක්ෂක ලේකම්, ජනාධිපති ඇතුළු රජයේ වගකිව යුතු අය තේරුම් ගත්තා. අන්න එදා තමයි මම හිතන හැටියට ඒ අය තීරණය කළේ රත්තරන් පිහිය වුනත් ඇනගන්න බැහැ කියන කියමන. සරත් පොන්සේකා යුද්ධය මෙහෙයවපු, සහ යුද්ධය අවසානය දක්වා ගෙනගිය, දක්ෂ, ජෙනරාල් කෙනෙක් බව ඇත්ත. ඔහුට විශාල ජනතා ගෞරවයක් ආදරයක් තිබුණු බවත් ඇත්ත. ඒත් එවැනි පුද්ගලයෙක් රට විනාශ මාර්ගයකට ගෙනියන්න ලෑස්ති වෙනව වගේ පෙනෙනවා නම් කරන්න තියෙන්නේ ඔහු ඒ තැනින් ඉවත් කරන එක. ආණ්ඩුව ඉතා උපක්‍රමශීලීව ජනතාවටත් නොදැනෙන විදියට ඔහු ඉවත් කළා, ඔහුට හිටපු තත්වෙටත් වඩා උසස් තනතුරක් දීලා. ඒ උසස්වීමත් සමග ජෙනරාල් තටු කපපු කුරුල්ලෙකුගෙ තත්වෙට වැටුණා.

සරත් පොන්සේකාගේ සැබෑ තත්වය පෙනෙන්න පටන්ගත්තෙ එතැන් සිට. ඔහු රජයට එරෙහිව අන්තිම සතුරෙක් වුණා. යුද්ධය දිනූ හමුදාපති කෙනෙක් හීනෙන්වත් හිතන්නෙ නැති දේවල් කරන්න ඔහු පටන් ගත්තා. කොටි හිතවාදීන් එක්ක එකතුවුණා. ප්‍රභාකරන්ගේ අම්ම තාත්තෙනුත් පිහිට පැතුවා. ශ්‍රීලංකා හමුදාවෙ අභිමානය සම්පූර්ණයෙන්ම කිළුටු කළා, විතරක් නෙවෙයි, හමුදාව යුධ අපරාධවලට සම්බන්ධය කියලා පාවලා දුන්නා. ආරක්ෂක ලේකම් යුද සිරකරුවන්ට වෙඩිතියන්න අණ දුන්නයි කියලා ප්‍රසිද්ධියේ කිව්වා. ශ්‍රීලංකාවට එරෙහිව විදේශික රටවල් යුද්ධ අධිකරණයට යනවා නම් තමා ශ්‍රීලංකාව කර ඇති යුද අපරාධ ගැන සාක්කිදෙන බවත් මේ සතියේ ඔහු බීබීසී ප්‍රවෘත්ති වලට පුන පුනා කිව්වා. මේ ක්‍රියාවන් ද්‍රෝහිකම් ඇර වෙන මොනවද? ලෝකෙ කිසිම රටක හමුදාපතිවරයෙක් කරන්න තියා හිතන්නෙවත් නැති නිහීන වැඩක් ඒක. එහෙම මිනිහෙක් රටේ ජනාධිපති වෙන්නත් ඉල්ලුවා. ඒ ඉල්ලුවෙ පැන්ෂන් යන්න ලෑස්තිවෙලා හිටි තමාට කාලය දීර්ඝකරලා හමුදාපතිකම දීපු, ඒවගේම යුද්ධ කරන්න අවශ්‍ය සියළුම දේ ගෙන්නලා දීපු රටේ නායකයට එරෙහිව. බහුතර ජනතාවට ඒක තේරුම් ගිය නිසා තමයි ඒ අය හරිහැටි ඡන්දෙ සුදුසු පුද්ගලයට දුන්නෙ.

රුසියාව, චීනය හෝ කියුබාව වැනි රටක හමුදා නායකයෙක් ෆොන්සේකා වගේ හැසිරුණා නම් ඒ රාජ්‍යයන් මෙපමණ ඉවසන්නෙ නෑ. ඒ මුල් දවසෙම අත්අඩංගුවට ගන්නවා. ඊට පස්සෙ රාජද්‍රෝහියෙකුට දියයුතු ඉහළම දඬුවම ඔහුට දෙනවා, කිසි සමාවක් නෑ. ඔවුන් කිසිසේත් රත්තරන් පිහිය වුනාට ඇනගන්නෙ නැහැ. ලංකාව වගේ රටක ඉපදීමත්, ඒ වගේ සමාජෙක ජීවත්වෙන්න ලැබීමත් ගැන හිටපු ජෙනරාල් සරත් පොන්සේකා ඇත්තටම සතුටු විය යුතුයි.

♦ **වෙලේගෙදර රාළ London**